**විසර්ජන ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

1.1 **දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) රජයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම

(ආ) ආදායම් එකතු කිරීම

(ඇ) විමධ්‍යගත අයවැය වැඩසටහන හා ගමනැගුම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

(ඈ) මැතිවරණ සම්බන්ධීකරණය කිරීම

(ඉ) අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම

(ඊ) පළාත් සභා කාර්යයන්ට සහාය වීම

1.2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) මහියංගණය

(ආ) රිදිමාලියද්ද

(ඇ) කන්දකැටිය

(ඈ) මීගහකිවුල

(ඉ) සොරණාතොට

(ඊ) ලුණුගල

(උ) බදුල්ල

(ඌ) පස්සර

(එ) හාලිඇල

(ඒ) ඌවපරණගම

(ඔ) වැලිමඩ

(ඕ) ඇල්ල

(ක) බණ්ඩාරවෙල

(ග) හපුතලේ

(ච) හල්දුම්මුල්ල

## 1.3 විගණන විෂය පථය

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 13 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | නිල නිවාසවල ඉන්වෙන්ට්‍රි ලේඛන | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 8.2 වගන්තිය |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iii) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 |
| (iv) | ලැබීම් වර්ගීකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 538 |
| (v) | පොදු තැන්පත් තුලන ගිණුම | මුදල් රෙගුලාසි 565(3) |
| (vi) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 |

(ආ) **විසර්ජන ගිණුම**

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.540,175,217 ක් වූ අතර වර්ෂය අවසාන වනවිට ඉන් රු.519,666,565 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 20,508,652 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.8 ක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 398,075,000 | 477,525,217 | 10,259,600 | 2.15 |

| | | | | |
|---|---|---|---|---|
| මූලධන | 62,650,000 | 62,650,000 | 10,249,052 | 16.36 |
| එකතුව | 460,725,000 | 540,175,217 | 20,508,652 | |

(ii) අයවැය විචලනය

- වැය විෂයන් දෙකක් සඳහා සළසා තිබුණු රු. 875,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ත් සියයට 95 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව යෝජිත ඉතිරි කිරීම් ඇතුළත් වන පරිදි සංශෝධිත ඇස්තමේන්තුවක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 19 කින් හා දෙපාර්තමේන්තු 16 කින් පිළිවෙලින් රු. 3,140,558,799 ක් හා රු. 1,286,846,067 ක් වශයෙන් රු. 4,427,404,866 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු.3,022,785,962 ක් හා රු. 1,260,036,164 ක් වශයෙන් රු.4,282,823,126 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. 144,582,740 ක් හෙවත් ලැබී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 3.3 ක ඉතිරියක් අනාවරණය විය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**එක් ගමකට එක් වැඩක් - ගම නැගුම වැඩසටහන**

- සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,114,008 ක වියදමින් ඉදිකරන ලද කන්දේඅරාව කීරියගොල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරිමේදී කොන්ක්‍රීට් ඇතිරීමට පෙර පොලිතීන් අතුරා නොතිබූ අතර ඒ වෙනුවෙන් රු.7,686 ක් කොන්ත්‍රාත්කාර සමිතිය වෙත ගෙවා තිබුණි.

- බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.18,106,086 ක් වටිනා කර්මාන්ත 19 ක්ද, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.30,082,900 ක් වටිනා කර්මාන්ත 22 ක් ද, පරිපාලනය කිරිමට ක්ෂේත්‍ර ලොග් සටහන් පොත් භාවිතා කර නොතිබූ අතර කර්මාන්ත අධික්ෂණය භාර නිලධාරින් කර්මාන්ත පරික්ෂා කළ බවට හෝ අවශ්‍ය උපදෙස් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදුන් බවට සාක්ෂි නොතිබුණි.

- හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග දෙකක ඉන්ටලොක් ගල් ඇතිරීමේදී මීටර් 13.11 ක් වැඩිපුර මිනුම් කර තිබීම නිසා ඉන්ටලොක් ගල් ඇතිරීම හා ගංගා වැලි ඇතිරීම යන විෂයයන් සඳහා රු.68,054 ක් අදාල කොන්ත්‍රාත් සමිතිවලට වැඩිපුර ගෙවා තිබුණි.

- පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද මාර්ග මිල ගණන් යොදාගෙන ඇස්තමේන්තු පිළියෙල කරන අතර එම මිල ගණන් වල පොදුකාර්ය පිරිවැය සඳහා සියයට 10 ක් වෙන්කර සාම්පල් පරීක්ෂා කිරීමේ වියදමද අන්තර්ගත කර තිබුණි. නමුත් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉන්ටලොක් ගල් ඇතිරිමේ ව්‍යාපෘතිවලදී ඉන්ටලොක් ගල් පරීක්ෂා කිරීම සඳහා ලාභ හා පොදුකාර්ය වියදම් සියයට 20 ක් ඇතුළත් කර විශේෂිත මිල ගණන් පිළියෙල කර ඉන්ටලොක් ගල් ඇතිරීමේ ව්‍යාපෘති 30 ක් සඳහා රු.524,530 ක මුදලක් නැවත ඇස්තමේන්තුවට ඇතුළත් කර එම මුදල අදාල කොන්ත්‍රාත්කාර සමිති වලට ගෙවා තිබුණි.

- ඇස්තමේන්තු පිළියෙල කිරීම
  ----------------------------------

2011 සැප්තැම්බර් 02 දිනැති අංක MED/RE දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2011 වර්ෂයේ ගමනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල උපදෙස් මාලාවේ 4 ඡේදය ප්‍රකාරව ගමනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මුළු ඇස්තමේන්තුව මත සියයට 20 ට නොවැඩි ප්‍රමාණයකට නුපුහුණු ශ්‍රමය සඳහා අඩු කළ යුතු විය. එම විධිවිධාන නොසළකා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු

ලබන කොන්ත්‍රාත්කරුට ගෙවිය හැකි උපරිම මුදල මත සියයට 20 ට නොවැඩි ප්‍රමාණයක් නුපුහුණු ශ්‍රමය තක්සේරු කිරීම හා ව්‍යාපෘතිය සඳහා යොදාගන්නා ලද නුපුහුණු ශ්‍රමය නියමාකාරයෙන් තක්සේරු නොකිරීම තුළින් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනුග්‍රාහක සමිති 15 ක් සඳහා රු.418,854 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

ඉහත ලිපියේ උපදෙස්වලට පටහැනිව බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 හි ව්‍යාපෘති 567 ක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරිමේදී ද්‍රව්‍ය, ශ්‍රමය හා වෙනත් වියදම් වෙන වෙනම ගෙන ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. ඒ සඳහා මාර්ග හා ගොඩනැගිලි මිල ගණන් යොදාගෙන ඇස්තමේන්තු පිළියෙල කිරීම තුළින් ලාභය ලෙස රු.39,706,049 ක මුදලක් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි.

- විමධ්‍යගත අයවැය වැඩසටහන

  ------------------------------------

  මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.661,650 ක් වටිනා භාණ්ඩ ඒකක 437 ක්ද, සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.29,450 ක් වටිනා උදළු තල 74 ක්ද, ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.354,000 ක් වටිනා උපකරණ 183 ක්ද, ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ගබඩාවල තිබුණි.

- දිවිනැගුම සංවර්ධන වැඩසටහන

  -------------------------------------

  - 2012 වසරේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,019,875 ක් හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,494,400 ක් වටිනා පැල බෙදාදීමේදී 2012 ජුලි 10 දිනැති අංක 2/2012 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 05.01.02 ඡේදයේ සඳහන් උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

  - ඉහත චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව ප්‍රතිලාභීන් හඳුනාගැනීම සඳහා පහසුකාරක නිලධාරීන්ගේ දායකත්වය හා අවශ්‍ය තාක්ෂණික හා ව්‍යාපෘතිමය සේවා නිලධාරීන් සම්බන්ධ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ග්‍රාම නිලධාරීන් හැර වෙනත් කිසිම නිලධාරියෙකු එසේ කටයුතු කළ බවට සාක්ෂි නොතිබුණි.

  - බදුල්ල හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ගෘහ ඒකක 195 ක නියැදි පරීක්ෂාවට අනුව ඉහත සඳහන් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ගෘහ මට්ටමේ අධීක්ෂණය සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම සඳහා ලබාදෙන පොත් කිසිදු ගෘහ ඒකකයකට ලබාදී නොතිබුණි.

- දිවිනැගුම වැඩසටහන යටතේ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා සුළු අපනයන භෝග මිලදී ගැනීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට 2012 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණ රු.536,685 කින් රු.320,156 ක් වටිනා පැල 2013 ජුලි 10 දින වන විටත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබී නොතිබුණි.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක දිවිනැගුම වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 150 ක් සඳහා රු.322,000 ක් වැය කර කිකිළි පැටවුන් 1380 ක් සහ පවුල් 52 ක් සඳහා කුකුල් කූඩු සඳහා ආධාර ලබාදී තිබුණි. මෙයින් තෝරාගත් ප්‍රතිලාභී පවුල් 92 ක් නියැදි පදනම මත පරීක්ෂාවේදී ලබාදී ඇති කිකිළි පැටවු 920 කින් 180 ක් මියගොස් තිබුණ අතර, 199 ක් විකුණා තිබුණි. ඉතිරි වී ඇති පැටවු සංඛ්‍යාව 571 කි. මියගිය කිකිළි පැටවුන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට පශු වෛද්‍ය කාර්යාල දැනුවත් කර නොතිබුණි.

- ගම් කිකිළි පැටවු වෙනුවට ෆාම් කිකිළි පැටවු ලබාදීම, කුකුල් කූඩු නියමිත ප්‍රමිතියට සකස් කර නොතිබීම හා කිකිළි පැටවු නඩත්තු වියදම් ලැබෙන ප්‍රතිලාභයට වඩා අධික වීම වැනි අඩුපාඩු නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

- **ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය**
  **ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය**
  **---**

- මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 1994 හා 1995 වර්ෂ සඳහා ලබාදී තිබුණ රු.270,000 ක්වූ චක්‍රීය ණය අරමුදලින් ගෙවීම් පැහැර හැර ඇති සමිති 10 ක සාමාජිකයින් 32 දෙනෙකුගෙන් රු.108,245 ක් අයවිය යුතුව තිබුණි. අක්‍රීය සමිති 08 ක් සඳහා ලබාදී තිබුණු රු.200,000 ක ණය මුදල් අදාල අරමුණ සඳහා යොදා නොගෙන එම සමිතිවල බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණි.

- වැලිමඩ හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් චක්‍රීය ණය අරමුදලින් කාන්තා සමිති 05 කට ලබාදුන් ණය මුදලින් ප්‍රතිලාභීන් 12 දෙනෙකුගෙන් රු.129,175 ක ණය මුදල් ආපසු අයකර ගෙන නොතිබුණි.

- හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කිරි වීදුරුව වැඩසටහන සඳහා ලබාදී තිබුණ ප්‍රතිපාදනවලින් සියයට 55 ක් වන රු.209,483 ක් ඉතිරිව තිබියදී පෙර පාසල් 21 ක ළමුන් 827 ක් සඳහා මෙම වැඩසටහන හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.

- **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

  කැපකරු දෙගුරු ආධාර වැඩසටහන යටතේ 2012 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා ලබාදී තිබුණ රු.327,600 කින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අදාල වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.200,100 ක මුදලක් ඉතිරිව තිබුණි.

- **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

  2005 මැයි 18 දිනැති අංක 12/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 08/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයින් 23 දෙනෙකුට රු.1,363,294 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 27601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 42,000,000 | 38,854,061 | 26,000,000 | 47,719,150 | 146,000,000 | 123,760,136 |

විෂය අංක 27601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශන ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව

රු.7,563,702 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම්
------------------------

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.442,362,249 ක් විය. එම ශේෂය තුළ වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,571,414 ක් වූ තැන්පතු 70 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 වත්කම් කළමනාකරණය
-----------------------------

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම
---------------------------------------

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 35 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් නිල නිවාස 10 කට අදාලව 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

## 1.7 අනුකූල නොවීම
--------------------

නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ආයතන සංග්‍රහය | | |
| (i) | XIX පරිච්ඡේදයේ 5 වගන්තිය | 153,656 | ලුණුගල හා මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිල නිවාස දෙකක පදිංචි |

| | | | |
|---|---|---|---|
| | | | නිලධාරීන් දෙදෙනෙකුගෙන් කුලී අයකර නොතිබුණි. |
| | | 19,374 | සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයකරන නිල නිවාස කුලී වැටුප් වර්ධක සමග සංශෝධනය නොකර ඒකාකාරීව අයකර තිබුණි. |
| (ii) | XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය | 67,752 | සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවාසවල පදිංචි නිලධාරීන් දෙදෙනෙකුගේ කලත්‍රයන්ගෙන් නිල නිවාස කුලී අයකර නොතිබුණි. |

(ආ) මුදල් රෙගුලාසි

| | | | |
|---|---|---|---|
| (i) | මු.රෙ.371(5) | 315,149 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලද අතුරු අග්‍රිම අදාල කාර්යය නිම වීමෙන් පසු ගිණුම් වර්ෂය අවසානයේ ඒ ඒ ආයතනවලට නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| (ii) | මු.රෙ.751 | 682,689 | බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගත් භාණ්ඩ තොග පොත්වල ඇතුළත් කර නිකුත් කිරීමේ නියෝග මගින් නිකුත් කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් වාහන 12 ක මාස 06 කට වරක් සිදුකළ යුතු ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

(iv) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2010 මැයි 25 දිනැති අංක 04/2010 දරන චක්‍රලේඛයේ 08 (11) ඡේදය | 29,220 | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන සේවකයින්ගෙන් අයකර |

ගන්නා ලද දායක මුදල් මාසිකව එම අරමුදලට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

නිසි ප්‍රමිතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති හා කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති ආදිය පිළිබඳව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) නිසි ප්‍රමිතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති

ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.725,166 ක වියදමින් ඉදිකරන ලද ඉදිගහදෝව ප්‍රජා ශාලාව අනුමත සැලැස්මක් සකස් නොකර ඉදිකර තිබුණ අතර ගොඩනැගිල්ල වටේ බිත්තියේ ඉහළ සිට පහළට පිපිරුම් ස්ථාන 25 ක් තිබුණි. ගොඩනැගිල්ලේ වේදිකාවද ස්ථාන 15 කින් පුපුරා තිබුණ අතර දඟර වානේ වැරගැන්වීමේදී මිලි මීටර් 16 කම්බි 05 ක් අඩුවෙන් යොදා තිබුණි. එහි යකඩවල බර අනුව වටිනාකම රු.10,985 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

### (ආ) කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

ප්‍රමාද වී ව්‍යාපෘති ආරම්භ කර ඇති අවස්ථා පහත පරිදි විය.

(i) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතු වටිනාකම රු.2,052,373 ක් වන වෙලන්හින්න ප්‍රධාන මාර්ගය ඉදිකිරීම සහ හපුතලේ දුම්රිය පොළ මාර්ගය සංවර්ධනය කිරීම යන කර්මාන්ත දෙකෙහි වැඩ 2012 දෙසැම්බර් 14 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ii) 2012 ජුනි 20 දින වැඩ අවසන් කළයුතු වූ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිකපොත නැගෙනහිර නව ගම්මාන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය ඉදිකිරීම් කටයුතු 2012 සැප්තැම්බර් 18 දින ආරම්භ කර තිබුණි.

## 1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළයුතු ශේෂ

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙළ කළ බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වු තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | එකතුව |
| | | රු. | රු. | රු. | රු. |
| (අ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 141,933 | - | - | 141,933 |
| (ආ) | හඳුනා නොගත් හර | - | - | 69,299 | 69,299 |

## 1.10 පාඩු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු පාඩු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාහන අනතුරු 03 සම්බන්ධයෙන් වාර්තා ලබාගැනීම හා රු.136,475 ක අලාභ අයකර ගැනීමේ කටයුතු ප්‍රමාද කර තිබුණි.

(ආ) 2008 වර්ෂයේදී හා 2009 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අනුව මහියංගණ ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයේ රු.49,205 ක් වටිනා අයිතම 80 ක ඌනතාවය සම්බන්ධ පරීක්ෂණ 2012 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

## 1.11 කළමනාකරණ දුර්වලතා

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ආදායකයන් වෙත භාර නොදෙන ලද රු.3,180,292 ක් වටිනා චෙක්පත් 141 ක් සුරක්ෂිතාගාරයේ තැන්පත් කොට නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නිලධාරින් 34 දෙනෙකුගේ පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක ස්ථාවර වත්කම් අංක නොකිරීම,පොදු 287, 288, 290 ලේඛන යාවත්කාලීන නොකිරීම නිසා වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

## 1.12 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 46 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 45 | 20 | 25 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1050 | 796 | 256 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 137 | 125 | 24 | 12 |
| (v) | වෙනත් (අනියම්) | - | - | - | - |
| | | 1284 | 987 | 311 | 14 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 311 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.